


"ඒය්... අන්න ආනන්ද මේ පැත්තට එනවා."
"මේ පැත්තට ද? මෙහාට ද? "
'අපෙ අප්පෝ දැං ඔහෙත් එක්ක කතා කරන්න ඕන අද්දගාත් විබහගෙ පාස් කරලා. "
"ආ....න...න්...ද.. මෙහාට එනවෝ..ඕ....දැං තේරුනයි ? "

'ඔන්නොහොම කියන්න කො 'වහෙං ඔරෝ' බාසාවෙං නැතුව' මම ඇඳි පුටුවෙන් නැගී ඉස්තෝප්පුවට ගියෙමි. ආනන්ද බියෙන් හැකෙන් මෙන් ඉදිරියට ඇදේ.

ආනන්ද ගේ අම්මා මගේ ඇවැස්ස නෑනා ය. සිරියාවති හාමිනේ දැක අඳුනා ගන්නට කලිං මා යාලු වී සිටියේ ඈ.. සෝමා සමගයි. මා ඇයට පිටු පෑයේ සිරියාවතී හාමිනේ නිසා ය. සෝමා මට වයිර බැන්දේත් ඒ නිසා ය. එදා මගේ වයස අවිරුදු විසි පහක් වූ අතර සෝමා ගේ වයස යන්තම් අවිරුදු දාසයක් විය.

සෝමා සිරිපාල සමග විවාහ වූයේ ඊට අවිරුදු දහයකට පමණ පසුය. හා හා පුරා කියා ඕවින් අපේ නිවසට ගොඩ උනේ ආනන්ද ගේ මහන පිංකමට ආරාදනා කරන්නටය. අවිරුදු පහලොවේ දී මහන වූ ආනන්ද පැවිදි බිමේ රැඳී සිටියේ අවිරුදු දහයකි.

මන්ත්‍රීතුමා ගේ 'වග්ගෝලයකු' වූ සිරිපාල නිසා ආනන්ද හාමුදුරුවන්ට ගමේ ම ඉස්කෝලේ ගුරු පත්වීමක් ලැබුනේ ය. ඉස්කෝලෙ රස්සාව කරමින් ම ඔහු පන්ඩිත විබහගයත් උපාදියත් සමත් විය. ඔහු පැවිදි බිමට ආයුබෝවන් කීයේ මීට අවිරුදු තුනකට පමණ පෙර ය. එම ඉස්කෝලයේ ම ගුරුවරියක වූ විමලා සමග පැවති ගනුදෙනුව 'ඕසිරප්පු' වීමෙන් මාස කීපයකට පසු ය ඒ.

''ආනන්ද කලිං කියලා නේ එන්න තිබුණා?''
''ඇයි මාමෙ''
''නෑ ඉතිං දන්නැද්ද. තොරණක් බැඳලා... බෙර කාරයො ගෙන්නලා.... පෙරහරිං වඩම්ම ගෙන.....''
''අනේ අම්මාපල් ඔහේගෙ කට ... ඒ දරු-වෝට ගෙට ගොඩවෙන්නවත් ඇරියෙ නෑ....''

''ආනන්ද පුතා දන්නවා මගේ කටේ හැටි ඇරත් අවිරුදු දහයක් විතර අපට බන කියාපු ආනන්ද ඕවෝට හෙල්ලෙන්නෑ නේද පුතා... එන්න පුතා ගෙට''

ගෙට ගොඩ වූ ආනන්ද මටත් සිරියාවතී හාමිනේටත් දන ගසා වැන්දේය. සාලයේ ඉඳගත් අපි ආ ගිය පුවත් කතා කරමින් සිටියෙමු.

''ආනන්ද පුතාට එන්න තිව්නෙ ඊයෙ. එහෙනං අපේ පුතාලා දෙන්නත් හම්බ වෙන්න තිබුනා. ඒ දෙන්නා අඹු දරුවොත් එක්ක ඊයෙ දවසම මෙහේ'' සිරියාවතී හාමිනේ කීහ.
''අපරාදෙ.. දැනං හිටියා නං අය්යලා බලන්නත් එක්ක එන්න තිව්නා''
සිරියාවතී හාමිනේ කුස්සියට ගොස් කැවිං, දොදොල්, කෙසෙල් ගෙඩි බන්දේසියක් ගෙනවුත් ආනන්දට පිළිගැන්නුවා ය.
''ඕන්න .... ආනන්ද එන ආරංචියට මං කැවිනුයි දොදොලුයිත් හැදුවා''
''පාන්දර කාක්කෙක් අඬන්නැති නේද නැන්දෙ''
''ඇත්තමයි. කාක්කො දෙන්නෙක් තරගෙට ඇඬුවෙ''
''හාපෝ.... නැන්දා හැදුවා නං කාලා ඉවරයි.....

"ඕවා අර දයාවතී ලමයාගෙ කැවිං. අපේ ලොකූ ගෙ නෝනා - සීතා දොදොල් හදං ආවා."
''ඇයි මාමෙ ඊයෙ මෙහේ මොකක් හරි උත්සවයක්ද?
''ඔව්...ඔව්.. මං ඊයේ කසාද බැන්දා නේ"
''අනේ සාදු.... මං හිතුවෙ නෑ මාමා මෙච්චර ඉක්මනට බඳීය කියලා... කව්ද ඉතිං මනමාලි?''
''මනමාලි ද? ඔය ඉස්සරහිං ගෙනත් කියලා තියෙන්නෙ ඒ බඩු කෑල්ල තමයි.''
අපි තුන්දෙනාම එකට සිනාසුනෙමු.

''ඒක හොඳයි... ඊයේ ජුනි දහ වෙනිදා. මාමා ඊයේ බැන්දා. මාත් හිතං ඉන්නෙ ලබන මාසෙ විසි වෙනිදා, මාමා පැන්න වලට ම පනින්න.''
''ඇහ්'' මම උඩ ගොස් බිම වැටුනෙමි. එහෙත් ඒ බවක් ඇඟවෙන්නට නොදී ''ආනන්ද බඳිනවා? කොහෙන්ද පුතා''
''මාමාට ආරංචිත් ඇති, අර අපේ ඉස්කෝලෙ ඉඳලා මාරු වෙලා ගිය සීතා ''
''ංආ... මගේ කනෙත් වැටිලා තිබුණා ඔය කතාව. ඒත් මං ඉතිං හිතුවා ඒක කටකතාවක් කියලා. ඒක හොඳයි. හොඳ හැදිච්ච ගෑනු ළමයා.''
''ඔව් මාමෙ. අම්මයි තාත්තයිත් ගුරුවරු හොඳ වැදගත් මිනිස්සු. මාමයි නැන්දයි වරදවා තේරුං ගන්න එපා. මං අද ආවෙ මාමාටයි නැන්දාටයි කියලා යන්න විතරයි. අම්මයි තාත්තයි එක්ක මං ආයි එනවා මාමාටයි නැන්දාටයි ආරාදනා කරන්න.
''අම්මට සිරි... හෙනං මහ ජෝඩුවත් මෙහෙ එනවා? පුතා ඒක කියාපු එක හොඳයි. මං එහෙනං තොරනකුත් බැඳලා බෙර කාරයො, නැට්ටුවො ගෙන්නලා....''
''ඇයි මාමෙ පාවාඩ දාන් නැද්ද?''
''නෑ.. නෑ.. අපේ මිදුල සුදු වැලි. ඇරත් සපත්තු සෙරෙප්පු දාගෙන එන අයට පාවාඩ ඕන්නෑ.''
ආනන්ද යළිත් වරක් අප දෙදෙනාට වැඳ සමු ගත්තේ ය. සිරියාවතී හාමිනේ කැවිං දොදොල් පාසලක් ආනන්දට දී ''මේං පුතා මහ ජෝඩුවගෙ පංගුව. ඊයෙ අපේ මගුල්ගේ නොකිව්වාට අමනාප වෙන්න එපා කියන්න.''
ගේට්ටුව ලඟ දී ආපසු හැරී බැලූ ආනන්ද අපට අත වනා නොපෙනී ගියේ ය. (ඉතිරි කොටස ලබන කලාපයේ)

# STANHOPE PRINTING
**FOR OFFSET AND DIGITAL PRINTING**

සිඩ්නි සහ මෙල්බර්න් ශ්‍රී ලාංකිකයනට කදිම අවස්ථාවක්

- Labels
- School Magazines
- News Letters
- Business Stationery
- Annual Reports
- Special Publications
- Posteres
- Brochures
- Greeting Cards
- Business Cards
- Flyers
- Price Lists

**ALL YOUR PRINTING NEEDS....**

ඔබගේ සියලුම මුද්‍රණ කටයුතු සඳහා පහත සඳහන් අංකයනට අමතන්න

මුද්‍රණ ඇනවුම් සඳහා තැපැල් ගාස්තුවලට අයකිරීමක් නොමැත

**LAKSHMAN**
**TEL.(02) 9626 7660**
**MOB.0405287243**

# 58 වන නිදහස් සැමරුම

## ඕස්ට්‍රේලියාවේ ශ්‍රී ලංකා මහකොමසාරිස් ජනාධිපති නීතිඥ කේ. බාලපටබැඳි මහතාගේ නිදහස් දින පණිවුඩය



**අපගේ මවුබිම** අවුරුදු සිය ගණනක් අධිරාජ්‍යවාදී, පාලනයෙන්, නිදහස් වී ස්වෛරී රාජ්‍යයක් වී අවුරුදු 58 ක් ගතවීම අත දින සමරන්නෙමු. ජාති, ආගම්, කුල, භේදයෙන් තොරව අප ජාතික කොඩිය වටා එක්වී සියලුම ලාංකිකයෝ අද දින ඔවුන්ගේ ඒකාග්‍රතාවය හා ජාතික අභිමානය විදහාපාති. ජාතික දිනය සමරන අද දින මාගේ උණුසුම් සුභ පැතුම් සියලුම ශ්‍රී ලාංකිකයින්ට හා සුභපතන්නන් වෙත පුද කිරීමට කැමැත්තෙමි. අද දින ඔබ සැමට මාගේ හෘදයාංගම පැතුම වන්නේ සමෘද්ධිය, ප්‍රීතිය හා සෞභාග්‍යමත් කාලයක් උදාවේවා යන්නයි.

දැනට අවුරුදු 58 කට පෙර අපගේ නායකයින් හා ජනතාව ජාති ආගම් භේදයකින් තොරව හා අප්‍රතිහත ධෛර්යයකින් යුතුව කරන ලද විවිධ කැපකිරීම් හේතුවෙන් අපට නිදහස ලබා ගැනීමට හැකිවිය. නිදහස ලබා ගැනීම සඳහා එලෙස කැපවීමෙන්, වීරත්වයෙන් හා ජීවිත පරිත්‍යාගයෙන් කටයුතු කළ පක්ෂ නායකයින් ඇතුළු සියළුදෙනාමටම මෙම අවස්ථාවේ අප සැවොම හිසනවා බුහුමන් දක්වමු.

අප, ලෝකයේ ඉපැරණි සභ්‍යත්වයක්, විශිෂ්ඨ සංස්කෘතියක්, ජාතික උරුමයක් ඇති ජාතියක් වෙමු. අද දින මේ මොහොත ඉතිහාසයේ අප ආ ගමනේ ජාතික ජයග්‍රහණයන් සාක්ෂාත් කර ගැනීම් හා අසාර්ථකත්වයන් විදහා පෑමට හොඳ අවස්ථාවකි. අපගේ ඒ දීර්ඝ ගමන මුළුමණින්ම රෝසමල් මාවතක් නොවීය. අප ජාතියේ යහපත් අනාගතයක් සඳහා අද අප මුහුණ දිය යුතු ගැටළු දෙස සිත යොමු කරමු. දැනට සති කීපයකට පෙර වසරක් සම්පූර්ණ වූ සුනාමි ව්‍යසනය සිදුවූ ඒ දෙසැම්බර් 26 දින අප කොහේ ජීවත් වූවත් අප සැවොම එකට අවධි වූයෙමු. ඒ මහා විපත්තියේ දී අප සැවොම එක් ජාතියක් මෙන් එකට එකතු වී විපතට පත්වූවන්ට උදව් කිරීමට කැමැත්තෙන්ම විශිෂ්ඨතම ආකාරයෙන් ඉදිරිපත් විය. මෙම විපත, මිනිස් ජීවිතයේ අස්ථිරත්වය හා මිනිසාට තර්ජනයක් වන ස්වභාවික බලවේගයක් වුවද, එය අප සියල්ලන්ම අපගේ විවිධාකාර වෙනස්කම් නොතකා එකමුතු කිරීමෙන් මිනිස් ජීවිතයේ ඇති විශිෂ්ඨත්වය පෙන්නුම් කරන්නක් විය.

ශ්‍රී ලාංකික ඉතිහාසයේ ජාතික ආරක්ෂාව පිළිබඳ තදබල තර්ජනයක් ඇති අවස්ථාවක් අපි දැන් පසු කරමින් සිටිමු. රටේ නීතිය හා සාමය බිඳ වැටීම වැලැක්වීම සඳහා ශ්‍රී ලංකා ජනාධිපතිතුමා හා රජය සියළු ප්‍රයත්න දරමින් සිටී. ජාතියක් වශයෙන් නිදහස ලැබීම අර්ථවත් වන්නේ රටේ ස්වෛරීභව හා රාෂ්ට්‍රීය ඒකාග්‍රතාවයට තර්ජනයක් හෝ ප්‍රචණ්ඩක්‍රියා නොපැවැතුනනෙහාත් පමණි. වඩාත් ප්‍රජාතන්ත්‍රවාදී සමාජ ක්‍රමයක් පවත්වාගෙන යාමටත්, ශක්තිමත් ආර්ථිකයක් ගොඩනගා ගැනීමේ අපේක්ෂාවත් සාක්ෂාක් කර ගැනීමටත් සියළුම විෂමතාවන් අභිබවා අපගේ ජාතික එකමුතුව පවත්වාගෙන යා යුතුවේ.

රටට සෞභාග්‍ය උදාකර ගැනීමේ මේ ගමන අභියෝගාත්මක ඉලක්කයකි. එය අප්‍රතිහත ධෛර්යයකින් හා සාමූහික ප්‍රයත්නයක් මගින් ලබාගත යුතු දෙයකි. පාර්ලිමේන්තුවේදී ඒකච්ඡන්දයෙන් සම්මත වූ අතිගරු ජනාධිපතිතුමා විසින් ඉදිරිපත් කළ 2006 අයවැය යෝජනා රට සංවර්ධනය කිරීම සඳහා මනාව සැලසුම් කළ ප්‍රායෝගික ක්‍රියාවලියකි. සමාජ හා දේශපාලන නිදහසත්, ශක්තිමත් ආර්ථික දියුණුවත් එමගින් ලබා ගැනීමට නම් සාමය, ඉවසීම හා කැපවීම අවශ්‍ය වේ. එම ඉලක්ක කරා ළඟාවීමට අපගේ සාමුහික ප්‍රයත්නයක් තිබිය යුතුවේ.

විද්‍යාව හා තාක්ෂණයේ විප්ලවීය දියුණුව නිසා දියුණු වූ රටවල පමණක් නොව ආසියානු කලාපයේ සංවර්ධනය වන රටවල්ද ඉතා ඉක්මණින් වෙනස්වෙමින් පවතී. අප වටා වූ රටවල සිදුවේගන යන මෙම අඛණ්ඩ සංවර්ධන ප්‍රවාහය දෙස අප බැලිය යුත්තේ සමාජ, දේශපාලන හා ආර්ථික සෞභාග්‍යයක් කරා යාමේ නව ප්‍රවර්ධනාත්මක දෘෂ්ඨියකිනි.

අන් ජාතීන් අපේ පවතින ඉවසිලිවන්තකම දෙස පරීක්ෂණාත්මක බැල්මක් හෙලන බව පෙනී යයි. අප වසර සිය ගණනක් වූ ශ්‍රේෂ්ඨ ඉතිහාසය තුළ සාමය ඉවසීම හා මෛත්‍රීය මුල් කොටගත් උතුම් බෞද්ධ දර්ශනයේ හා වෙනත්, ශ්‍රේෂ්ඨ ආගම්වල ආශිර්වාදය ලබා ඇත. අපගේ රටේ සමාජ ස්ථාවරත්වය රඳවා තබා ගැනීමේ ශක්තිමත් ආයුධය වන්නේ සංස්කෘතික උරුමය වශයෙන් අප ලැබූ ඒ ස්වයං පාලනය හා ඉවසීමයි.

අතිගරු ජනාධිපතිතුමා ඇතුළු ශ්‍රී ලාංකික ජනතාවගේ එකම අභිලාශය මෙම ගැටුම සාමකාමී අන්දමින් විසඳා ගැනීමයි. මා මෙහිදී තිලෝගුරු බුදුරජාණන් වහන්සේ විසින් දේශිත ධම්මපදයේ සඳහන් එක් ගාථාවක් උපුටා දැක්වීමට කැමැත්තෙමි. ''නහී වෙරේන වේරානි - කම්මං නීච කුදාජනං - වෛරයෙන් වෛරය නොසන්-සිඳේ '' මෙය සදාකාලික ධර්මතාවකි. සාමය හා සෞභාග්‍ය කරා අප යන ගමන හිමින් වුවද ශක්තිමත් හා ස්ථාවර වූවකි. එය අපට ළඟා විය හැකි ඉලක්කයකි. ඒ කරා ලඟ වීමට අපට අවශ්‍ය වන්නේ ප්‍රජාතන්ත්‍රවාදය ගරු කරන, බහුමතය ගරුකරන, මිනිසත්කම අගයන නොබෙදුනු එක්සත් සමාජයකි.

නිදහස සැමරීම සඳහා ඔබගේ පැමිණිම හා සහභාගීත්වය පිළිබඳව මා ස්තුති වන්ත වෙමි. ඔබගේ එක්සත්කම, ඒකාග්‍රතාව හා මිත්‍රත්වය ඉදිරි කාලයේදී වඩාත් ශක්තිමත් වී ශ්‍රී ලංකාව සෞභාග්‍ය කරා ළඟා වේවායි ප්‍රාර්ථනා කරමි.
ස්තුතියි.

**ජනාධිපති නීතිඥ කේ. බාලපටබැඳි**
ශ්‍රී ලංකා මහකොමසාරිස්
2006 පෙබරවාරි මස 04 දින
ශ්‍රී ලංකා මහකොමසාරිස් කාර්යාලය.